# 4. ආගන්තුකයන්ගේ ආදරය

රවීට සහ රාධාට පාසල් නිවාඩු ලැබුණා. අම්මයි, තාත්තායි සමග නාවලපිටියේ ඉන්න ආච්චි සහ සීයා බලන්න යන්න සූදානම් වුණා. පාන්දරින් නැගිට කොටුවේ දුම්රිය පොළට ගියා. දුම්රිය බදුල්ලට යන්න පිටත් වුණා.

මේ අය ඉදිරිපිට තවත් පවුලක් සිටියා. ඒ පවුලේ අම්මාත්, තාත්තාත් ළමයින් දෙදෙනෙකුත් සිටියා. ටික වේලාවකට පසු රවී සහ රාධා අර ළමයින් දෙදෙනාත් සමග කතා කරන්නට පටන් ගත්තා.

රවී සහ රාධා, අමර සහ නයනා, කැවුම් කොකිස් ද, වඩේ, මුරුක්කු ද බෙදා ගෙන කෑවා. එකට සෙල්ලම් කරමින් විනෝද වුණා. අම්මලා තාත්තලා එකිනෙකා අඳුනා ගත්තා.

නාවලපිටියට ළඟා වන විට රවී සහ රාධා ඔවුන්ගේ දෙමව්පියන් සමග දුම්රියෙන් බහින්න සූදානම් වුණා. අමර සහ නයනා බදුල්ලට යන බව කීවා. ඔවුන් ඔවුන්ගේ ලිපින ලියාගෙන ලියුම් හුවමාරු කර ගැනීමට පොරොන්දු වුණා. කොළඹින් පිටත් වන විට මේ අය අඳුනන්නේවත් නැහැ. දැන් නම් හොඳට ම යාළුයි. නත්තල් කාලයේ හමු වීමට බලාපොරොත්තු වෙන බව කියමින් සමු ගත්තා.

## පැවරුම්

1. විවිධ ජාතීන්ට හා ආගම්වලට අයත් ළමුන්ගේ චිත්‍රයක් අඳින්න.
2. ඔබ පන්තියේ සිටිනා විවිධ ජාතීන්ගේ හා ආගම්වලට අයත් ළමුන් සමග මිත්‍රත්වය වර්ධනය කර ගන්න.